අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/5/67

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2018.02.09

Information and Communication Technology Branch
0 2 N
Ministry of Education "Isurupaya" Battaramulla

**චක්‍රලේඛ අංකය: 04/2018**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාශ භාර නියෝජ්‍ය/
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන්,

**<u>අධ්‍යාපන අමාත්‍යාංශය සහ ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධව පවත්වනු ලබන සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය - 2018 (සිංහල මාධ්‍ය)</u>**

**01 හැඳින්වීම සහ අරමුණ :**

දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා කටයුතු කිරීම අරමුණු කර ගනිමින් පාසල් පද්ධතියෙහි සිංහල නාට්‍ය කලාව ප්‍රවර්ධනය කිරීම මෙහිලා අපේක්ෂිත ය.

පාසල් ශිෂ්‍ය ප්‍රජාවගේ නිර්මාණශීලීත්වය, පෞරුෂ වර්ධනය, දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කරමින්, යහපත් පුරුදු වලින් හෙබි නිපුණතා පූර්ණ ශිෂ්‍ය සමාජයක එකමුතුව, විනයගරුක බව හා නායකත්වය පිළිබඳ ව භාවිතයෙන් ම අත්දැකීම් ලබාගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින්, නිර්මාණශීලී රසඥතාවෙන් පිරි ප්‍රඥාසම්පන්න, ගුණගරුක පුරවැසියන් ලෙස අනාගතයේ දී රටට දායාද කිරීමේ අභිලාශයන් මෙම තරගය වාර්ෂික ව සංවිධානය කෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පූර්ණ අනුග්‍රහයෙන් යුතු ව, ටවර් හෝල් රඟහල පදනම විසින් මෙම තරගය මෙහෙයවනු ලබයි.

මෙම තරගයට ඉදිරිපත්වීමෙන් පාසල් ප්‍රජාව සතු ගායන - වාදන - නර්තන හා රංගන හැකියාවන් හා අනෙකුත් අනුෂංගික අංශයන් සම්බන්ධ සෞන්දර්යාත්මක නිර්මාණශීලී දක්ෂතා හඳුනා ගැනීමටත්, ඒවා පෝෂණය කිරීමටත් මහඟු අවකාශ සැලසේ. එමෙන් ම ඒ සඳහා නිරත වන ගුරුභවතුන් සතු නිර්මාණශීලී කෞශල්‍ය ද මෙම තරගයෙන් පෝෂණය වේ.

**02 තරග අංශ :**

2:1 නූර්ති නාට්‍ය ජවනිකා
2:2 කෙටි නාට්‍ය
2:3 දිගු නාට්‍ය

**03 තරග කොන්දේසි :**

**3:1 නූර්ති නාට්‍ය ජවනිකා**

3:1:1 නිර්දිෂ්ට නෘත්‍ය නාට්‍ය

**(අ) නීතිඥ ජෝන් ද සිල්වාගේ වෙස්සන්තර, ශ්‍රී වික්‍රම, සිරිසඟබෝ හා රාමායණය**

**(ආ) නීතිඥ චාල්ස් ඩයස්ගේ විදුර හා පද්මාවතී**

3:1:2 නිර්දිෂ්ට නෘත්‍ය නාට්‍ය වලින් **එකක්** තෝරගෙන සංවාද හා ගීත ඇතුළත් අඛණ්ඩ නාට්‍ය කොටසක්, අර්ථහානි නො වන ලෙස නිෂ්පාදනය කළ නූර්ති නාට්‍ය ජවනිකාවක්.

3:1:3 කාලය විනාඩි 25 – 30 අතර වේ.

3:1:4 නිර්දිෂ්ට නාට්‍ය කෘති හා ගීත සහිත සංයුක්ත තැටි පහසු මිලට ටවර් හෝල් රඟහල පදනමෙන් ලබාගත හැකි ය.

**3:2** කෙටි නාට්‍ය

3:2:1 පාසල් සිසු සිසුවියන්ගේ පෞරුෂ වර්ධනයට ඉවහල් වන, ළමා මනසට උචිත, පාසල් පද්ධතියට ගෝචර නිර්මාණශීලී ස්වීය පිටපතකින් කළ නිෂ්පාදනයක්.

3:2:2 පරිවර්තන හෝ අනුවර්තන ඉදිරිපත් කළ නොහැක.

3:2:3 ළමා නාට්‍ය නොවිය යුතු ය.

3:2:4 කාලය විනාඩි 25 – 30 අතර වේ.

3:2:5 A4 ප්‍රමාණයේ කඩදාසි වල තනි පැත්තේ යතුරු ලියනය කළ හෝ පරිගණක අකුරු සංයෝජනය කළ හෝ පැහැදිලි අත් අකුරින් ලියූ නාට්‍ය පිටපතෙහි පිටපත් 02 ක් පළාත් වටයේ දී විනිශ්චය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

**3:3** දිගු නාට්‍ය

3:3:1 ඉහත අංක 3:2:1, 3:2:2, 3:2:3 හා 3:2:5 අදාළ වේ.

3:3:2 කාලය විනාඩි 60 – 90 අතර වේ.

**04** පොදු කොන්දේසි **:**

4:1 එක් පාසලකට තරග අංශ තුනටම සහභාගී විය හැකි ය. එසේ වන්නේ නම්, මේ සමඟ ඇති අයදුම්පත්‍රයේ ඡායා පිටපත් යොදා ගනිමින් වෙන් වෙන් වශයෙන් අයදුම් කළ යුතු ය.

4:2 සෑම නිර්මාණයකට ම සහභාගී කර ගත හැකි **අවම රංගන ශිල්පීන් සංඛ්‍යාව 03 කි.** මීට අමතරව **ශිල්පීන් උපරිම වශයෙන් 40 ක් විය යුතු ය.** නාට්‍යයට සම්බන්ධ සමස්ත සිසු ගුරු ප්‍රජාව මෙම සංඛ්‍යාවට ඇතුළත් වේ.

4:3 නාට්‍යයකට සම්බන්ධ කරගත හැකි උපරිම ශිල්පීන් සංඛ්‍යාව ඉක්මවා යන්නේ නම්, ඊට පිළිගත හැකි හේතු ලිඛිත ව ඉදිරිපත් කොට, පළාත් වටයේ විනිශ්චයට පෙර ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අනුමැතිය ලබාගත යුතු ය.

4:4 අයදුම්කරුවෙකු කවර හෝ හේතුවක් මත වෙනත් පාසලකට මාරු වී ඇත්නම්, පාසල් දෙකෙහි ම විදුහල්පතිවරුන්ගේ එකඟතාව මත අයදුම්කරුට කැමති පාසලකින් තම නිර්මාණය ඉදිරිපත් කළ හැකි අතර, ඒ පිළිබඳ ව විදුහල්පතිවරුන් දෙදෙනාගේ ම එකඟතාවන් ලිඛිත ව අදාළ විදුහල්පතිවරුන් මගින් ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා එවිය යුතු ය.

4:5 වෙනත් නාට්‍ය තරගයකට තමා ඉදිරිපත් කළ කිසිදු නාට්‍ය පිටපතක් මෙම තරගයට ඉදිරිපත් නො කළ යුතු අතර, අනුන්ගේ පිටපත් හෝ විකෘති කරන ලද නාට්‍ය පිටපතක් හෝ වංචනික ලෙස ඉදිරිපත් කර ඇති විටෙක ඒ සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ට දන්වා තරගයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බැවින්, එවැනි ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන් ම වැළකී සිටිය යුතු ය.

4:6 මෙම තරගයට ඉදිරිපත් වන නාට්‍ය, වෙනත් තරගයකට ඉදිරිපත් කරන්නේ නම්, ඒ බව ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ව දන්වා අනුමැතිය ලබාගත යුතු ය.

4:7 සෑම නාට්‍යයක ම අධ්‍යක්ෂණය, අයදුම්පත ඉදිරිපත් කරන පාසල් ගුරු භවතෙකු විසින් සිදුකළ යුතු අතර, **එහි රංගනය, ගායනය හා නර්තනය සඳහා එම පාසලේ ම සිසු සිසුවියන් පමණක් සහභාගී විය යුතු ය.**

4:8 කෙටි හා දිගු නාට්‍ය පිටපත් රචනය අදාළ පාසලේ ගුරු භවතෙකුට හෝ එහි ශිෂ්‍යයෙකුට ශිෂ්‍යාවකට සිදුකළ හැකි ය.

4:9 නාට්‍යයට අවශ්‍ය සංගීතය, වාදනය, ශබ්ද සංයෝජනය, අංග රචනය ඇතුළු සෙසු ආනුෂංගික අංශ සඳහා අයදුම්පත යොමු කරන පාසලෙන් ගුරු භවතුන් හෝ සිසු සිසුවියන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, ඒ සඳහා දිවයිනේ වෙනත් පාසලක ගුරු භවතුන් හා සිසු සිසුවියන් ඊට සහභාගී කර ගත හැකි ය. එහෙත් ඒ සඳහා එම පාසල් වල විදුහල්පතිවරුන් හා අයදුම්පත ඉදිරිපත් කළ පාසලේ විදුහල්පති විසින් ලිඛිත අවසර ලබා දී තිබිය යුතු ය. එම අවසර ලිපි පළාත් වටයට පෙර ටවර් හෝල් රඟහල පදනම වෙත එවිය යුතු ය.

4:10 පළාත් වටය සඳහා ලබා දෙනු ලබන දිනයට හා වේලාවට නිශ්චිතව ම තම නාට්‍යය විනිශ්චය සඳහා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකගේ වගකීම වේ. මෙය අවසාන වටයට තෝරා ගත් නාට්‍ය සඳහා ද අනතුරුව වලංගු වේ.

4:11 පළාත් වටයේ දී නාට්‍යය ඉදිරිපත් කළ යුත්තේ අයදුම්පත යොමු කළ පාසලේ දී හෝ නාට්‍ය අධ්‍යක්ෂ විසින් තෝරාගත් වේදිකාවක දී ය. මෙහි දී එම නාට්‍යය පළාත් තරග විනිශ්චයට අදාළ දිනයේ හා වේලාවේ දී මහජන ප්‍රදර්ශනයක් ලෙසින් ද සිදු කිරීමට අධ්‍යක්ෂවරයාට අවකාශ ඇත. එහි දී විනිශ්චය මණ්ඩලය සඳහා ඉදිරිපස ආසන 05 ක් වෙන් කළ යුතු ය.

4:12 **අයදුම්පත් එවීමෙන් පසු සෑම නාට්‍යයක ම නිෂ්පාදන කටයුතු ආරම්භ කළ හැකි ය.**

4:13 ඉහත සඳහන් කොන්දේසි උල්ලංඝනය කළ හොත්, එම නාට්‍යය ඕනෑම අවස්ථාවක දී තරගයෙන් ඉවත් කිරීමට ටවර් හෝල් රඟහල පදනමට අයිතිය ඇත.

4:14 තරග සංවිධානය, විනිශ්චය මණ්ඩලය පත්කිරීම, විනිශ්චය පිළිබඳ ගැටළු නිරාකරණය හා තරග කොන්දේසි උල්ලංඝනය හා සම්බන්ධ සියලු තීරණ ගැනීමේ වගකීම ටවර් හෝල් රඟහල පදනම සතු ය. මෙම තරගයේ විනිශ්චය සිදුකරන විනිශ්චය මණ්ඩලයෙහි තීරණය අවසාන හා තීරණාත්මක වේ.

**05** තරග පැවැත්වෙන ආකාරය :

**5:1** ප්‍රථම අදියර - අයදුම්පත් කැඳවීම

5:1:1 පහත සඳහන් ආකාර මගින් අයදුම්පත් ලබාගත හැකිය.

(අ) ටවර් හෝල් රඟහල පදනම වෙතින් හෝ එහි නිල වෙබ් අඩවිය වූ www.towerhall.lk මගින්

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk නිල වෙබ් අඩවියෙන්

(ඇ) පළාත් සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින්

5:1:2 අයදුම්පත් එවිය යුතු ලිපිනය

**අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම, 123, සච්සිරිපාය, විජේරාම මාවත, කොළඹ 07.**

5:1:3 අයදුම්පත් එවිය යුතු අවසාන දිනය

**2018 මාර්තු 31**

**5:2** දෙවන අදියර - නාට්‍ය අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම

5:2:1 තරගය සඳහා ඉදිරිපත් වූ නාට්‍ය අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සහ කෙටි හා දිගු නාට්‍ය පිටපත් පිළිබඳ එක්දින සම්මන්ත්‍රණය 2018 අප්‍රේල් මාසයේ දී, කොළඹ දී පැවැත්වේ.

5:2:2 මෙහි දී තරගය පිළිබඳ ව හා නාට්‍ය පිටපත් පිළිබඳ ව සාර්ථක අවබෝධයක් ලබාගත හැකි වේ.

5:2:3 මෙම සම්මන්ත්‍රණයට සහභාගී නො වන අධ්‍යක්ෂවරුන්ගේ නාට්‍ය තරගයෙන් ඉවත් කෙරේ.

**5:3** තෙවන අදියර - පළාත් වටයේ තරග විනිශ්චය

5:3:1 පළාත් වටයේ තරග විනිශ්චයට තෝරාගනු ලබන්නේ දෙවන අදියරයේ දී සහභාගී වූ අධ්‍යක්ෂවරුන්ගේ නාට්‍ය පමණි.

5:3:2 තරග විනිශ්චය සැප්තැම්බර් දෙවන සතියේ සිට ඔක්තෝම්බර් අවසාන සතිය දක්වා පැවැත්වේ. (පොදු කොන්දේසි 4:10 හා 4:11 බලන්න)

5:3:3 අවසාන වටය සඳහා නාට්‍ය තෝරා ගැනීමේ අදියර මෙය බැවින්, පරිපූර්ණ නාට්‍ය නිර්මාණයක් ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

5:3:4 පිළිගත හැකි හේතුවක් මත නාට්‍යයක් පළාත් වටයේ විනිශ්චයට ඉදිපත් නො කරන්නේ නම්, ඒ බැව් ප්‍රදර්ශනයට නියමිත දිනට **අවම වශයෙන් දින 07 කට පෙර** නාට්‍ය අධ්‍යක්ෂ විසින් ටවර් හෝල් රඟහල පදනමට ලිඛිතව දැන්විය යුතු ය.

5:3:5 උක්ත 5:3:4 කොන්දේසිය උල්ලංඝනය කළහොත්, අදාළ නාට්‍ය අධ්‍යක්ෂවරයා ඊට වගකීමට බැඳී සිටී යි.

5:3:6 පළාත් වටයේ තරගයේ දී කුසලතා දක්වන සිසු ගුරු ශිල්පීන් සඳහා සම්මාන සහතික ප්‍රදානය කෙරේ.

**5:4** සිව්වන අදියර - තෙදින නේවාසික වැඩමුළුව

5:4:1 අවසාන වටයට තෝරාගත් නාට්‍ය වල නාට්‍ය අධ්‍යක්ෂවරුන් හා සංගීත අධ්‍යක්ෂවරුන්/ ආනුෂාංගික ශිල්පීන් සඳහා තෙදින නේවාසික වැඩමුළුවක් 2018 දෙසැම්බර් මුල් සතියේ දී පැවැත්වේ.

5:4:2 අවසාන වටයට තෝරාගත් සෑම නාට්‍යයක ම අවම වශයෙන් අධ්‍යක්ෂක හෝ නාට්‍යයට සම්බන්ධ ගුරුභවතෙකු මෙම වැඩමුළුවට සහභාගීවීම අනිවාර්ය වන අතර, එසේ සහභාගී නො වන නාට්‍ය අවසාන වටයෙන් ඉවත් කෙරේ.

**5:5** පස්වන අදියර - අවසාන වටය

5:5:1 අවසාන වටය 2019 පෙබරවාරි/ මාර්තු මාසයේ දී නාට්‍ය උළෙලක් ලෙස කොළඹ දී පැවැත්වේ.

5:5:2 අවසාන වටයට සහභාගී වන සෑම නාට්‍යයක ම ශිල්පීන් සඳහා සහභාගීත්ව සහතික පිරිනැමෙන අතර, කුසලතා දක්වන ගුරු - සිසු ශිල්පීන් සඳහා ඊට අතිරේක ව සහතික හා ත්‍යාග පිරිනැමේ.

5:5:3 අවසාන වටය නියෝජනය කරන සෑම නාට්‍යයක් සඳහා ම සහනදායී ප්‍රවාහන මුදලක් ප්‍රදානය කරනු ලබන අතර, එහි දී නාට්‍ය අධ්‍යක්ෂ සඳහා රු. 7,500.00 ක මුදලක් ලබාදෙනු ලබයි.

**5:6** සයවැනි අදියර - තිළිණ හා සම්මාන ප්‍රදානය

5:6:1 මෙම උළෙල 2019 අප්‍රේල් මාසයේ දී උත්සවාකාරයෙන් කොළඹ දී පැවැත්වේ.

5:6:2 මෙම උළෙලට සහභාගීවීමේ දී සිසු සිසුවියන් පාසල් නිල ඇඳුමින් හා ගුරුභවතුන් උත්සවයේ ගෞරවය රැකෙන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී පැමිණීම අනිවාර්ය වේ.

5:6:3 අවසාන වටයේ කුසලතා පළ කළ ශිල්පීන්ට ත්‍යාග, සම්මාන හා සහතික මෙහි දී ප්‍රදානය කෙරේ.

**06** **තිළිණ හා සම්මාන ප්‍රදානය :**

| තරග අවස්ථාව | නූර්ති ජවනිකා | කෙටි නාට්‍ය | දිගු නාට්‍ය (ස්වීය) |
|---|---|---|---|
| හොඳම සංගීත අධ්‍යක්ෂණය | රු. 15,000.00 | රු. 10,000.00 | රු. 15,000.00 |
| හොඳම වේදිකා පසුතල නිර්මාණය | රු. 15,000.00 | රු. 10,000.00 | රු. 15,000.00 |
| හොඳම රංගවස්ත්‍ර නිර්මාණය | රු. 15,000.00 | රු. 10,000.00 | රු. 15,000.00 |
| හොඳම අංග රචනය | රු. 15,000.00 | රු. 10,000.00 | රු. 15,000.00 |

| | | | |
|---|---|---|---|
| හොඳම සහාය රංගනය (නිළි) | රු. 10,000.00 | රු. 10,000.00 | රු. 10,000.00 |
| හොඳම සහාය රංගනය (නළු) | රු. 10,000.00 | රු. 10,000.00 | රු. 10,000.00 |
| හොඳම රංගනය (නිළි) | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම රංගනය (නළු) | රු. 15,000.00 | රු. 15,000.00 | රු. 15,000.00 |
| හොඳම පිටපත 3 වන ස්ථානය | - | රු. 7,500.00 | රු. 15,000.00 |
| හොඳම පිටපත 2 වන ස්ථානය | - | රු. 10,000.00 | රු. 20,000.00 |
| වසරේ හොඳම පිටපත | - | රු. 15,000.00 | රු. 25,000.00 |
| වසරේ හොඳම අධ්‍යක්ෂණය | රු. 25,000.00 | රු. 20,000.00 | රු. 30,000.00 |
| හොඳම නිෂ්පාදනය 3 වන ස්ථානය | රු. 25,000.00 | රු. 20,000.00 | රු. 30,000.00 |
| හොඳම නිෂ්පාදනය 2 වන ස්ථානය | රු. 30,000.00 | රු. 25,000.00 | රු. 35,000.00 |
| වසරේ හොඳම නිෂ්පාදනය | රු. 40,000.00 | රු. 30,000.00 | රු. 40,000.00 |

අධ්‍යාපන අමාත්‍යාංශය හා ටවර් හෝල් රගහල පදනම ඒකාබද්ධව පවත්වන මෙම තරගාවලිය සාර්ථක කර ගැනීමට ඔබ දක්වනු ලබන සහයෝගය අතිශයින් ම අගයමි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

| අංශය | පළාත | අංකය |
|---|---|---|
| | | |

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ටවර් හෝල් රඟහල පදනම
## සමස්ත ලංකා පාසල් නාට්‍ය තරඟය - 2018
නූර්ති නාට්‍ය ජවනිකා/ කෙටි නාට්‍ය (ඒකාංක)/ දිගු නාට්‍ය

## අයදුම් පත්‍රය

තරඟ අංශය :..........................................................................................................

නාට්‍යයේ නම :..........................................................................................................

පාසලේ නම :..........................................................................................................

පළාත :.........................................................දිස්ත්‍රික්කය:.............................................

01 අයදුම්කරුගේ නම :.......................................................මයා/ මිය

ජාතික හැඳුනුම්පත් අංකය :..................................................................

ලිපිනය :..................................................................

..................................................................

දුරකථන අංකය : නිවස .......................... ජංගම .......................

02 පිටපත් රචකයාගේ නම :.......................................................මයා/ මිය

ජාතික හැඳුනුම්පත් අංකය :..................................................................

ලිපිනය :..................................................................

..................................................................

දුරකථන අංකය : නිවස .......................... ජංගම .......................

03 අධ්‍යක්ෂවරයාගේ නම :.......................................................මයා/ මිය

ජාතික හැඳුනුම්පත් අංකය :..................................................................

ලිපිනය :..................................................................

..................................................................

දුරකථන අංකය : නිවස .......................... ජංගම .......................

04 සංගීත අධ්‍යක්ෂවරයාගේ නම :.......................................................මයා/ මිය

ජාතික හැඳුනුම්පත් අංකය :..................................................................

ලිපිනය :..................................................................

..................................................................

දුරකථන අංකය : නිවස .......................... ජංගම .......................

05 පාසලේ නම :..........................................................

දුරකථන අංකය :..........................................................

06 කලාප අධ්‍යාපන කාර්යාල :..........................................................

ලිපිනය :..........................................................

දුරකථන අංකය :..........................................................

07 පාසලේ සිට ආසන්නතම ප්‍රධාන නගරය :..........................................

08 ප්‍රධාන නගරයේ සිට පාසලට දුර :..........................................

ඉහතින් දක්වා ඇති තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, මෙම තරගාවලියට අදාළ කොන්දේසි වලට අනුකූලව මෙම නූර්ති ජවනිකාව/ නාට්‍ය නිර්මාණය කරනු ලබන බවත්, මෙය වෙනත් කවර හෝ අයෙකු විසින් මීට පෙර රචනා කරන ලද්දක් හෝ අධ්‍යක්ෂණය කරන ලද්දක් හෝ ශ්‍රී ලංකාවේ කුමන හෝ නාට්‍ය තරගයකට කුමන හෝ මට්ටමකින් හෝ ඉදිරිපත් කළ නූර්ති ජවනිකාවක්/ නාට්‍යයක් නොවන බවත්,ස්ථිර කර ප්‍රකාශ කර සිටින අතර, ඉහත සඳහන් කරන ලද කුමන හෝ කරුණක් අසත්‍ය යැයි මෙම නාට්‍ය තරගාවලියේ කුමන හෝ අවස්ථාවක හෙළිදරව් වුවහොත්, ඉහත කී නූර්ති ජවනිකාව/ නාට්‍යය මෙම තරගාවලියෙන් ඉවත් කිරීමට ටවර් හෝල් රඟහලට ඇති අයිතිය පිළිගන්නා බවත්, මෙම නාට්‍ය තරගාවලියේ දී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස අවිවාදයෙන් පිළිගන්නා බවත්, මෙම නූර්ති ජවනිකාවට/ නාට්‍යයට සම්බන්ධ සියළුම ශිල්පීන් අදාළ කොන්දේසි අනුව තෝරාගත් අය බවත්, මෙම නිර්මාණය සඳහා රංගනයෙන් දායකවන සියළුදෙනාම මෙම පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් බවත් සහතික කර ප්‍රකාශ කර සිටිමි.

.................................... ....................................................

දිනය අයදුම්කරුගේ අත්සන

ඉහත චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව මෙම නූර්ති ජවනිකාව/ නාට්‍යය, නිර්මාණය කර ඇති බවත්, මෙම නිර්මාණයේ රංගනය සඳහා දායක වන සියළුම සිසු සිසුවියන් මෙම පාසලේ ඉගෙනුම ලබන අය බවත්, ඉහත අයදුම්කරු/ කාරිය, නාට්‍යයේ රචක හා අධ්‍යක්ෂක මෙම පාසලේ ගුරු මණ්ඩලයේ අය බවත්, අයදුම්පත මාගේ පූර්ණ අනුමැතිය මත ඉදිරිපත් කරන බවත්, නූර්ති ජවනිකාව/ නාට්‍යය, නිර්මාණය කර ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අනුග්‍රහය ලබාදෙන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

..................... .................................................... ..........................................................

දිනය විදුහල්පතිගේ/ විදුහල්පතිනියගේ නම විදුහල්පතිගේ/ විදුහල්පතිනියගේ අත්සන